# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1963/6 - 2016 අප්‍රේල් මස 18 වැනි සඳුදා - 2016.04.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය.*: KDS/TUM/04/01/03.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය.*: 4-3/9/2013/WS/478.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය* :-

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදසියපත්තුව කෝරළේ සුළු කොට්ඨාසයේ, නියඹේපොල ගමේ පිහිටි සර්වේයර් ජනරල් විසින් 2016.02.08 දිනැතිව මැන සකස් කරන ලද, අංක මහ 6537 දරන මූලික පිඹුරේ කැබලි අංක 1, 2 හා 3 වශයෙන් දැක්වෙන ''නාගහවෙල හේන *නොහොත්* ගෝවින්නේ හේන සහ නාගහවෙල හේන'' නැමති ඉඩම් වලින්, මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0283 ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් තුන:

**කැබලි අංක 01**

ඉඩමේ නම: නාගහවෙල හේන *නොහොත්* ගෝවින්නේ හේන; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0124.

*උතුරට* : සී. ජේ. දිසානායක හිමිකම් කියන ගෝවින්නේ හේන, මු. පි. මහ 6423 හි කැබලි අංක 1 සහ එච්. එම්. සෝමරත්න බණ්ඩා සහ තවත් අය හිමිකම් කියන ගල්වැටෙ හේන; *නැගෙනහිරට*: එච්. එම්. සෝමරත්න බණ්ඩා සහ තවත් අය හිමිකම් කියන ගල්වැටෙ හේන සහ කැබලි අංක 2 ;*දකුණට*: කැබලි අංක 2, එච්. එම්. සෝමරත්න බණ්ඩා හිමිකම් කියන නාගහවෙල හේන සහ ආර්. ජේ. ජේ. ප්‍රේමරත්න හිමිකම් කියන නාගහවෙල හේන *නොහොත්* ගෝවින්නේ හේන ;*බටහිරට*: ආර්. ජේ. ජේ. ප්‍රේමරත්න හිමිකම් කියන නාගහවෙල හේන *නොහොත්* ගෝවින්නේ හේන සහ සී. ජේ. දිසානායක හිමිකම් කියන ගෝවින්නේ හේන.

හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්;

1. ආර්. ජේ. ජේ. ප්‍රේමරත්න මහතා,
   අංක 55,
   හැදෙනිය,
   හාරිස්පත්තුව

**කැබලි අංක 02**

ඉඩමේ නම: නාගහවෙල හේන *නොහොත්* ගෝවින්නේ හේන; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0079.

මායිම්:

*උතුරට*: කැබලි අංක 1 සහ එච්. එම්. සෝමරත්න බණ්ඩා සහ තවත් අය හිමිකම් කියන ගල්වැටෙ හේන; *නැගෙනහිරට*: එච්. එම්. සෝමරත්න බණ්ඩා සහ තවත් අය හිමිකම් කියන ගල්වැටෙ හේන සහ කැබලි අංක 3 ;*දකුණට* : කැබලි අංක 3, සහ එච්. එම්. අබේරත්න බණ්ඩා හිමිකම් කියන නාගහවෙල හේන සහ එච්. එම්. සෝමරත්න බණ්ඩා හිමිකම් කියන නාගහවෙල හේන ;*බටහිරට*: එච්. එම්. සෝමරත්න බණ්ඩා හිමිකම් කියන නාගහවෙල හේන, ආර්. ජේ. ජේ. ප්‍රේමරත්න හිමිකම් කියන නාගහවෙල හේන *නොහොත්* ගෝවින්නේ හේන සහ කැබලි අංක 1.

හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්;

1. එච්. එම්. සෝමරත්න බණ්ඩා මහතා,
අංක 245,
හේනේගහ, මැදවල,
හාරිස්පත්තුව

**කැබලි අංක 03**

ඉඩමේ නම: නාගහවෙල හේන; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0080.

මායිම්:

*උතුරට*: කැබලි අංක 2 සහ එච්. එම්. සෝමරත්න බණ්ඩා සහ තවත් අය හිමිකම් කියන ගල්වැටේ හේන සහ මු. පි. මහ 6423 හි කැබලි අංක 2; *නැගෙනහිරට*: මු. පි. මහ 6423 හි කැබලි අංක 2, මු. පි. මහ 6379 හි කැබලි අංක 3 සහ එච්. එම්. අබේරත්න බණ්ඩා හිමිකම් කියන නාගහවෙල හේන ;*දකුණට*: එච්. එම්. අබේරත්න බණ්ඩා හිමිකම් කියන නාගහවෙල හේන සහ එච්. එම්. සෝමරත්න බණ්ඩා හිමිකම් කියන නාගහවෙල හේන; *බටහිරට*: එච්. එම්. සෝමරත්න බණ්ඩා හිමිකම් කියන නාගහවෙල හේන, සහ කැබලි අංක 2

හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්;

1. එච්. එම්. අබේරත්න බණ්ඩා මහතා,
අංක 245,
හේනේගම, මැදවල,
හාරිස්පත්තුව

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 මැයි මස 12 වැනි දින පෙ. ව. 10.00 ට තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 මැයි මස 05 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

තුසිතා එන්. ඩබ්. රණසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
තුම්පනේ.

2016 අප්‍රේල් මස 07 වැනි දින,
තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 - 25

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.